## නැතිවීම්/අලාභහානිවීම් ක්‍රියා පිළිවෙත

යුද හමුදාවේ ඇති සියලුම භාණ්ඩ දේපල ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදා වෙන්කර ඇත.

අ. පෞද්ගලික දේපල
ආ. රෙජිමේන්තු දේපල
ඇ. රජයේ දේපල

**පෞද්ගලික දේපල**

පෞද්ගලික දේපල යනු පුද්ගලයන්ට අයත් යම් යම් භාණ්ඩ හා උපකරණ වේ.

**රෙජිමේන්තු දේපල**

යම්කිසි ඒකක/ආයතනයක අරමුදල් වලින් ලබාගත් එම ඒකකයට හෝ ආයතනයට අයත් භාණ්ඩ හා උපකරණ වේ.

**රජයේ දේපල**

රජයේ දේපල යනුවෙන් හඳුන්වනු ලබන්නේ මහා භාණ්ඩාගාරය විසින් ආරක්‍ෂක අමාත්‍යාංශයට වෙන්කරන ලද මුදල් වලින් යුද හමුදාවේ ප්‍රයෝජනය සඳහා ලබාදී ඇති භාණ්ඩ හා උපකරණ වේ.

මුදල් රෙගුලාසි යටතේ නැතිවීම්/අලාභහානිවීම් ක්‍රියා පිළිවෙත අනුව ක්‍රියාකරනුයේ රජයේ දේපල යම් නැතිවීමකට හෝ අලාභහානියකට පත්වූ අවස්ථා වලදී පමණි. පුද්ගලික දේපල හා රෙජිමේන්තු දේපල යම් නැතිවීමක් හෝ අලාභහානියකට පත්වුව හොත් මුදල් රෙගුලාසි යටතේ කටයුතු කරනු නොලැබේ. අදාල ඒකක/ආයතන මට්ටමින් පරීක්‍ෂණ පවත්වා සුදුසු ක්‍රියා මාර්ග ගත යුතුවේ.

**නැතිවීම්**

සොරකමක් කිරීමක් හෝ වංචනික ලෙස ඉවත් කිරීමක් අයථා පරිහරණයකින් රජයේ දේපල නැතිවීමක් ලෙස හඳුන්වනු ලැබේ.

අලාභහානිවීම් ස්වාභාවික හේතුන් මත හෝ හිතාමතා හෝ අත්වැරදීමකින් රජයේ දේපල වලට වන හානි අලාභහානියක් ලෙස හඳුන්වයි.

යම් කිසි ඒකකයක හෝ ආයතනයක රජයේ දේපලකට සිදුවන නැතිවීම්/අලාභහානිවීම් සොයා ගැනීමෙන් පසු දින 03 ක් ඇතුලත යම් නැතිවීමක් හෝ අලාභහානියක් පිළිබඳව මුරෙ 104 (03) යටතේ ප්‍රාරම්භක වාර්ථාවක් තමාගේ ඒකකය අයිති උසස් මූලස්ථාන හරහා වත්කම් කළමනාකරණ අම වෙත ඉදිරිපත් කල යුතුවේ. නැතිවීමකට/අලාභහානියකට ලක්වූයේ සලාක ද්‍රව්‍ය, ඉන්ධන, දර, ගෑස් වැනි ශ්‍රීලයුසේබ නිකුත් කිරීමක් නම් ඉහත දක්වා ඇති මුරෙ 104 (03) දරණ ප්‍රාරම්භක වාර්ථාව අදාල උසස් මූලස්ථාන හරහා සැප්‍රඅම වෙත ඉදිරිපත් කල යුතුවේ. පිටපත් විගණකාධිපති හා ප්‍රධාන ගණකාධිකාරි වෙත ඉදිරිපත් කල යුතුයි.

මෙම ප්‍රාරම්භක වාර්ථාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මාස 03 ක් යාමට මත්තෙන් ඒ සඳහා සියලුම පරීක්‍ෂණ අවසන් කර මුරෙ 104 (04) අවසන් වාර්ථාව ප්‍රාරම්භක වාර්ථාව ඉදිරිපත් කල ආකාරයටම නියමිත උසස් මූලස්ථාන වෙතින් වකඅම/සැප්‍රඅම වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුවේ. මෙම නැතිවීම්/අලාභහානිවීම් සම්බන්ධව මූලික පරීක්‍ෂණ උසාවියක් මගින්

කටයුතු සිදුකරන්නේ නම් නැතිවීම්/අලාභහානිවීම් වලට ලක්වූ භාණ්ඩවල මිල ගණන් ලබාගැනීම සඳහා පහත සඳහන් නිළධාරින්ගේ අනුමැතිය ලබාගත යුතුවේ.

| | | |
|---|---|---|
| අ. | ඉංජිනේරුමය/උපකරණ | - අනි ඉසේරෙ ඒකකය වෙතින් |
| ආ. | සලාක ද්‍රව්‍ය, ඉන්ධන, දර ගෑස් | - ශ්‍රීලයුසේබ ඒකක වෙතින් |
| ඇ. | බෙහෙත් | - වෛද්‍ය සේවා අධ්‍යක්‍ෂක වෙතින් |
| ඈ. | අනෙකුත් සියලුම දේපල | - අනි ශ්‍රීලයුයුබ වෙතින් |

නැතිවීම්/අලාභහානිවීම් සම්බන්ධව මූලික පරීක්‍ෂණ උසාවියක් මගින් කටයුතු කරන අවස්ථාවක අදාල මුපළ වාර්ථාව යුධ හමුදාපතිගේ නිගමනය ලබාගැනීම පිණිස තම ඒකකය අයත් උසස් මූලස්ථාන හරහා නීතිසේවාඅම වෙත ඉදිරිපත් කල යුතු වේ. යුධ හමුදාපතිගේ නිගමනය සහිතව මුපළ වාර්ථා ඒකකය වෙත ලද පසුව ඉන් පිටපතක් උසස් මූලස්ථාන හරහා වකඅම සැප්‍රඅම වෙත ඉදිරිපත් කල යුතුවේ. නැතිවීම්/අලාභහානියකට ලක්වූ රජයේ දේපල සම්බන්ධව වගකිව යුතු අයවලුන්ගෙන් මුදල් අයකර ගැනීමට ඇත්නම් ඒ සඳහා හර වවුචර් පිළියෙල කර වගකිව යුතු අයගෙන් අත්සන් ලබාගෙන වැහාලේඅම වෙත ඉදිරිපත් කල යුතු වේ. වැහාලේඅම වෙතින් මුදල් අයකර ගැනීමට කටයුතු කල බවට සහතික කර ඒකක වෙත එවනු ලබන අතර, හර වවුචර් පිටපතක් අවසාන වාර්ථාව සමග ඉදිරිපත් කල යුතු වේ. නැතිවීම්/අලාභහානියකට වගකිව යුත්තේ සිවිල් සේවකයෙක් නම් ඔහුගේ වැටුප් භාර නිළධාරි අමතා අදාල මුදල අයකර ගැනීමට සහතිකයක් ලබාගෙන එම සහතිකය අවසාන වාර්ථාව සමග ඉදිරිපත් කල යුතුවේ. වකඅම එහි නැතිවීම්/අලාභහානිවීම් සිදුවී මාස 03 ක් යාමට මත්තෙන් 104 (04) අවසාන වාර්ථාව ඉදිරිපත් කිරීමට නොහැකි වන්නේ නම් එසේ ප්‍රමාද වීමට හේතුන් මාස 03 ක් යාමෙන් පසු එළඹෙන සෑම සතියක් සතියක් පාසා නියමිත උසස් මූලස්ථාන හරහා වකඅම/සැප්‍රඅම වෙත දැනුම් දිය යුතුවේ.

යම් නැතිවීමක්/අලාභහානියක් සිදුවූ පසු මූලික පරීක්‍ෂණ උසාවියක් මගින් එම නැතිවීම/අලාභහානියට වගකිව යුත්තෙක් නොමැති නම් මහජන අරමුදලින් කපා හැරීමට නිර්දේශ කල යුතු අතර, ඒ බව අවසාන වාර්ථාවේ සඳහන් කල යුතුවේ.

නැතිවීම්/අලාභහානියකට ලක්වූ භාණ්ඩවල වටිනාකම රුඃ 25,000.00 ට වඩා අඩුනම් ඒ සඳහා කපා හැරීමේ අනුමැතිය යුධ හමුදාපති විසින් ලබාදෙනු ලැබේ. රුඃ25,000.00 කට වැඩිවන අවස්ථාවලදී කපාහැරීමේ අනුමැතිය වකඅම/සැප්‍රඅම විසින් රජයේ ආරක්‍ෂක අමාත්‍යාංශය අමතා ලබාදෙනු ලබන අතර, එම අනුමැතිය උපයෝගි කරගෙන ඒකකය හෝ යම්කිසි ආයතනයක සිදුවන රජයේ දේපල සම්බන්ධව නැතිවීම්/අලාභහානිවීම් ලේඛණවලින් කපාහැරීමටත් එම බලය උපයෝගි කරගෙන නැවත තොගයට ලබාගැනීමටත් කටයුතු කල යුතුවේ.

නැතිවීම්/අලාභහානිවීම් පිළිබඳ ලේඛණයක් සියලුම මූලස්ථාන ඒකක විසින් නිකුත් කල යුතුය. එහි පහත සඳහන් සියලුම විස්තර ඇතුලත් කල යුතු වේ.

අ. සිදුවූ දිනය
ආ. පාඩුව පිළිබඳ විස්තරය
ඇ. ප්‍රාරම්භක වාර්ථාවේ යැවූ විස්තරය
ඈ. වටිනාකම
ඉ. අලුතින් තොගයට ගැනීම හෝ අලුත්වැඩියා කිරීමට යන වියදම
ඊ. අයකර ගැනීමට තීරණය කරන ලද මුදල
උ. අවසාන කොටස අයකරන දිනය
ඌ. කපා හැරීම සඳහා වූ බලය
එ. කපාහැරිය දිනය
ඒ. වෙනත් කරුණු

**<u>ත්‍රස්ථවාදී ක්‍රියා හේතුවෙන් සිදුවන නැතිවීම්/අලාභහානිවීම්</u>**

29/94 ට අනුව හමුදා චර්යා නියෝගයට අනුව ත්‍රස්ථවාදී ප්‍රහාර හේතුවෙන් යුධ හමුදාවට අයත් රජයේ දේපල වලට හානි සිදුවූ අවස්ථාවක පහත සඳහන් ක්‍රියාමාර්ග ගත යුතුවේ. පෞද්ගලික දේපල හා රෙජිමේන්තු දේපල ත්‍රස්ථවාදී ප්‍රහාර හේතුවෙන් සිදුවන විනාශ වීම් වලදී මෙම ක්‍රමය අනුගමනය කරනු නොලැබේ.

**<u>ත්‍රස්ථවාදී ප්‍රහාරයක් ඇතිවූ විට ඒකකයක්/ආයතනයක් විසින් ගත යුතු ක්‍රියා මාර්ග</u>**

අදාල ඒකකයේ අණදෙන නිළධාරි විසින් හෝ ආයතන ප්‍රධානියා විසින් ත්‍රස්ථවාදී ප්‍රහාර සිදුවී පැය 24 ක් යන්නට මත්තෙන් තම ඒකකය/ආයතනය පිහිටි පෙදෙස අයත් බළසේනා මූලස්ථානයට පහත සඳහන් කරුණු ඇතුලත් කර සංඥා පණිවුඩයක් යැවිය යුතුය.

අ. විනාශයට භාජනය වූ භාණ්ඩ ප්‍රමාණය

ආ. විනාශය සිදුවූ ස්ථානය, දිනය හා වේලාව

ඇ. විනාශය සිදුවූ ආකාරය පිළිබඳ කෙටි විස්තරයක්

මෙසේ යවනු ලබන සංඥා පණිවුඩයේ මාතෘකාව ත්‍රස්ථවාදී ප්‍රහාර හේතුවෙන් සිදුවන නැතිවීම්/අලාභහානිවීම් යනුවෙන් සඳහන් කළ යුතු අතර, වකඅම/සැප්‍රඅම නීතිසේවාඅම වෙතද දැනුම් දිය යුතුයි. ඉන් අනතුරුව හනි 29/94 ඇමුණුම අ දරණ ආකෘති පත්‍රයේ පිටපත් 07 කින් සම්පූර්ණ කර අනි විසින්ම අත්සන් තබා ඉන් පිටපත් 05 ක් ත්‍රස්ථවාදී ප්‍රහාර සිදුවී පැය 72 ක් යන්නට මත්තෙන් ආවරණ ලිපියක් මගින් සංඥා පණිවුඩය යොමුකල බළසේනා මූලස්ථානය වෙත ඉදිරිපත් කල යුතුවේ. එක් පිටපතක් තම ඒකකය අයත් රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත ඉදිරිත් කල යුතු වේ. යම් කිසි ඒකකයක් වෙත ත්‍රස්ථවාදී ප්‍රහාර එල්ල වූ පසු එම ඒකකය විසින් ගත යුතු මූලික ක්‍රියා පිළිවෙත මෙය වේ. ඉන් අනතුරුව මෙම ත්‍රස්ථවාදී ප්‍රහාරය සම්බන්ධ වූ සියලුම පරීක්ෂණ කටයුතු අවසන් වූ පසු හචනි 29/94 ට ඇමුණුම අ දරණ ආකෘති පත්‍රයේ පිටපත් 07 කින් සම්පූර්ණ කර ඉන් පිටපත් 05 ක් ආවරණ ලිපියක් මාර්ගයෙන් බළසේනා මූලස්ථානය වෙත ඉදිරිපත් කල යුතුය. මෙම ත්‍රස්ථවාදී ක්‍රියාවක් සිදුවූ පසු ඒකකය වෙතින් ගතයුතු අවසාන ක්‍රියා මාර්ගය මෙය වේ. මෙය අවසාන වාර්ථාව ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් ලියකියවිලි අවශ්‍යතාවය අනුව අමුණා යැවීමට කටයුතු කල යුතු වේ.

අ. නියමිත බලධාරින්ගෙන් ලබාගත් මිළ ගණන්.

ආ. විනාශයට පත්වූ භාණ්ඩ ලැයිස්තුව - මෙම භාණ්ඩ ලැයිස්තුව ඒකක අනි, බළසේනාධිපති සහ සේනාංක මූලස්ථානයේ කර්නල් පාලන- උපකරණ යන තනතුරු දරණ නිළධාරින් විසින් නිවැරදි බවට සහතික කර තැබිය යුතුයි.

ඇ. වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට ඇත්නම් එසේ අයකර ගැනීමට ක්‍රියාකරන ලද හර වවුචර් පිටපත්.

ඈ. මුපළ පැවැත්වූයේ නම් යුහපති නිගමනය සහිත මුපළ වාර්තාවේ මුල් පිටපත

ඉ. පොලිසියට පැමිණිල්ලක් කර ඇත්නම් එම පැමිණිල්ලේ පිටපත

ඊ. සිවිල් උසාවි ක්‍රියා මාර්ග ගෙන ඇත්නම් විනිසුරුගේ තීරණ ඇතුලුව නඩු වාර්ථා පිටපත්

**<u>බළසේනා මූලස්ථානය වෙතින් ගත යුතු ක්‍රියාමාර්ගයන්</u>**

ඒකකය විසින් ත්‍රස්ථවාදී ප්‍රහාරය සම්බන්ධව එවන ලද සංඥා පණිවුඩය සහ හචනි 29/94 ඇමුණුම අ ආකෘතිපත්‍රය බළසේනා මූලස්ථානයට ලද වහාම අදාල ඒකකය වෙතින් පරීක්ෂණ මණ්ඩලයක් පහත සඳහන් පරිදි පත්කිරීමට කටයුතු කල යුතුවේ.

පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන කැඳවීම් නියෝගයේ පිටපතක් වකඅම/සැප්‍රඅම, නීතිසේවාඅම, සේනාංක මූලස්ථානය හෝ ඒකකය හෝ ආයතනය අයත් රෙම වෙත හෝ උසස් මූලස්ථානය වෙත යැවිය යුතුය.

පරීක්ෂණ මණ්ඩල පත්කිරීමේදී අලාභය රුපියල් ලක්ෂයකට වඩා වැඩි නම් එම පරීක්ෂණ මණ්ඩලයේ සභාපති මේජර් නිළයේ අයෙකු හෝ ඉන් ඉහල නිළයක් දරනු අයෙකු නම්කල යුතු අතර, සෙසු සාමාජිකයින් දෙදෙනා අධිකාරිලත් නිළධාරින් දෙදෙනෙකු විය යුතුය. අලාභය රුපියල් ලක්ෂයට වඩා අඩුනම් පරීක්ෂණ මණ්ඩලයේ සභාපති ජ්‍යෙෂ්ඨ කපිතන් නිළයේ අයෙකු විය යුතුයි. සෙසු සාමාජිකයින් දෙදෙනා අධිකාරිලත් නිළධාරින් දෙදෙනෙකු විය යුතුයි.

ඉහත පරීක්ෂණ මණ්ඩලයේ සභාපති පත්කර ගැනීම සඳහා ඒකක බසේමු සමග සම්බන්ධතාවයෙන් කටයුතු කල යුතුවේ. අලාභය රුː ලක්ෂ 5කට වඩා ඉක්මවන අවස්ථාවලදී පරීක්ෂණ මණ්ඩලය සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ නියෝජිතයෙකු ලබාගත යුතුව ඇති හෙයින් බසේමු වෙතින් ඒකකයෙන් ලද හචනි 29/94 ඇමුණුම අ දරණ මූලික වාර්ථාව බළසේනාධිපතිගේ නිගමනය ඇතුලත් කර සේනාංක මූලස්ථානය වෙත ඉදිරිපත් කිරීමේදී ආවරණ ලිපියක පිටපතක් වකඅම/සැප්‍රඅම, නීතිසේවාඅම හා ඒකකය අයත් රෙම වෙත හා ඒකකය වෙත ඉදිරිපත් කල යුතුය. සාමාන්‍යයෙන් බසේමු වෙත ත්‍රස්ථවාදී ප්‍රහාර සම්බන්ධයෙන් ලැබෙන සියලුම වාර්ථා දින 07 ක් ඇතුලත සේමු වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකල යුතුවේ.

**<u>පරීක්ෂණ මණ්ඩලයක් විසින් ගත යුතු ක්‍රියාමාර්ග</u>**

පරීක්ෂණ මණ්ඩලය වෙතින් පහත සඳහන් කරුණු ආවරණය වන පරිදි අදාල පරීක්ෂණ මණ්ඩල වාර්ථා සකස් කල යුතුයි.

අ. ත්‍රස්ථවාදී ප්‍රහාරය හේතු කර ගෙන නැතිවීම්/අලාභහානිවීම් සිදුවූ ආකාරය.

ආ. මෙම ප්‍රහාරය හේතුකර ගෙන නැතිවීම්/අලාභහානිවීම්/විනාශයට පත්වූ භාණ්ඩවල වටිනාකම.

ඇ. මෙම නැතිවීම්/අලාභහානිවීම් සඳහා පුද්ගලයෙකු හෝ පුද්ගලයින් කිහිප දෙනෙකු වගකිව යුතුව ඇත්නම් ඒ පිළිබඳව නිර්දේශයකින් එසේම මෙම ත්‍රස්ථවාදී ප්‍රහාරය පිළිබඳව මුපළ මගින් පැවැත්විය යුතු බවට ඔවුන් අදහස් කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් වූ නිර්දේශයන්ද අදාල පරීක්ෂණ මණ්ඩල වාර්ථාවේ ඇතුලත් කල යුතුය.

මෙම වාර්ථාව සකස් කිරීමේදී හචනි 29/94 හි ඇමුණුම අ දරණ ආකෘතිපත්‍රයට අනුව සකස් කල යුතු අතර, යුආපා 21 මණ්ඩල වාර්ථාව සමග පිටපත් 05 කින් යුතුව මණ්ඩලයක් පත්කර සති 03 ක් ඉක්ම යාමට මත්තෙන් ත්‍රස්ථවාදී ප්‍රහාරයකට ලක්වූ ඒකකය වෙතින් බළසේනා මූලස්ථාන වෙත ඉදිරිපත් කල යුතු වේ. මෙම වාර්ථාව ඉදිරිපත් කරන ආවරණ ලිපියේ පිටපතක් වකඅම/සැප්‍රඅම, නීතිසේවාඅම, සේමු හා ඒකකය අයත් රෙම වෙතද යැවිය යුතුයි.

**<u>සේනාංක මූලස්ථානය වෙතින් ගත යුතු ක්‍රියාමාර්ග</u>**

අ. ත්‍රස්ථවාදී ප්‍රහාරය සිදුවූ විගස ඒකක අනි සහ බළසේනාධිපති විසින් නිසි අයුරු ක්‍රියා කරන්නේද යන්න පරීක්ෂාකාරි විය යුතුයි.

ආ. සේමු වෙත මේ සම්බන්ධව ලැබෙන හචනි 29/94 ඇමුණුම අ සහ ආ වාර්ථාවෙන් සේමු වෙත ලැබී දින 07 ක් ඉක්ම යන්නට මත්තෙන් සේනාංකාධිපතිගේ නිගමනය ඇතුලත් කර වකඅම/සැප්‍රඅම වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුවේ.